# Abstract 38

# පිරිත් මණ්ඩපය, ඒ ආශ්‍රිත සැරසිලි හා පූජා ද්‍රව්‍යවල සංකේතාත්මක වැදගත්කම

**ඒ. එම්. ප්‍රසාදි අප්සරා අදිකාරම්,**
(ශාස්ත්‍රවේදී (විශේෂ) තෙවන වසර - බෞද්ධ සංස්කෘතිය),
*apsaraprasadi89@gmail.com*

''**පරි**''පූර්ව ''**ත්‍රා**'' ධාතුවෙන් නිපන් සංස්කෘත ''පරිත්‍රාණ'', පාලි ''පරිත්ත'', සිංහල ''පිරිත්'' යන්නෙහි අර්ථය ආරක්ෂාව යන්න යි. **පරි** යන්නෙන් **හාත්පස** යන්න ද **ත්‍රාණ** යන්නෙන් **ආරක්ෂාව** යන අරුත ද දෙයි. හාත්පසින් පැමිණෙන සියලු උපද්‍රව වළකා ආරක්ෂාව සැලසීම පිරිතේ ප්‍රධාන කාර්යයකි. පිරිත් ධර්මය බුදුන් ධරමාන සමයයේ සිට ආරක්ෂක විධියක් ලෙස භාවිත වූ බවට නිදසුන් බෞද්ධ සාහිත්‍යයේ සඳහන් වේ. නූතනය වන විට එය චාරිත්‍ර වාරිත්‍ර සමුදායකින් හෙබි අභිචාර විධියක් ලෙස බහුල භාවිතයට පැමිණ තිබේ. පශ්චාත් කාලීනව අභිචාර විධියක් ලෙස සංවර්ධනය වී තිබේ. එහෙයින් ම බුදුරදුන්ගේ ශ්‍රී මුඛ දේශනාවලට අමතරව මන්ත්‍ර ස්වරූපයෙන් සැකසුණු සූත්‍ර සමුදායයක් ද වත්මන් පිරිත් දේශනාව තුළ අන්තර්ගත වේ. පිරිත් දේශනාවක් තුළ ප්‍රමුඛ වශයෙන් ත්‍රිවිධ රත්නයේ ආරක්ෂාව හා ආශීර්වාදය ගැබ් වන අතර විවිධ වූ අභිචාරාත්මක ක්‍රියා මඟින් ගුප්ත බලයන්ගේ ආරක්ෂාව ද ගැබ් කොට තිබේ. බෞද්ධයන් තම ජීවිතය හා සබැඳි බොහෝ කටයුතුවල දී පිරිත් දේශනයේ ආශීර්වාදය ලබා ගනී. තිස් පැයේ, තුන් තිස් පැයේ හා සති පිරිත් පැවැත්වෙනුයේ හතරැස් හෝ අටපට්ටම් හැඩයෙන් තැනූ විශේෂ මණ්ඩපයක් තුළ ය. එම මණ්ඩපය ඉදිකරනුයේ කහ දියර ඉස පවිත්‍ර කර ගත් භූමියක ය. මල්කමින් ලියකමින් මණ්ඩපය සරසා තිබේ. සුදුවතින් උඩු වියන් බැඳ ඒ මේ අතට යැවූ නූල් මත නා දලු, බුලත් කිණිති ආදිය එල්ලා තිබේ. මණ්ඩපයේ මැද **රාජගහ** පිහිටුවා තිබේ. එය ද චක්‍රාකාර සැරසිල්ලකින් යුක්ත ය. සන්ධ්‍යා කාලයේ ආරම්භ වන පිරිත් දේශනය සඳහා සධාතුක කරඬුව, පිරුවානා පොත් වහන්සේ හා භික්ෂූන් වහන්සේ භේරි නාද හා සාධුකාර මධ්‍යයේ වැඩම කරනු ලැබේ. මූලික වතාවත් නිමා වීමෙන් පසු භික්ෂූන් වහන්සේලා පිරිත් දේශනය ආරම්භ කරනු ලැබේ. විවිධ අරමුණු පෙරදැරි කරගෙන සංවිධානය කරනු ලබන පිරිත් දේශනය සඳහා ඉදිකරනු ලබන මණ්ඩපය, ඒ ආශ්‍රිත සැරසිලිවල හා ඒ සඳහා භාවිත කරනු ලබන පූජා ද්‍රව්‍යයන්ගේ සංකේතාත්මක වැදගත්කම අනාවරණය කිරීම මෙම අධ්‍යයනයේ අරමුණ යි.

**ප්‍රමුඛ පද :** පිරිත, පිරිත් මණ්ඩපය, පූජා ද්‍රව්‍ය, සංකේත, සැරසිලි